මින් ප්‍රධාන තීරණාත්මක සටනක් වන්නේ දයා පතිරණ ගේ නායකත්වයෙන් යුතු ස්වාධීන ශිෂ්‍ය කණ්ඩායම සහ ජ.වි.පෙ. අනුබද්ධ සමාජවාදී ශිෂ්‍ය කණ්ඩායම අතර කොළඹ විශ්ව විද්‍යාලය තුල පැන නැගුනු අරගලයයි. ඒ වන තෙක්ම කොළඹ විශ්ව විද්‍යාලය තුල ජ.වි.පෙ. නියෝජනයක් නැති තරමට ම විය. අවිශිබමය තුල කොළඹ විශ්ව විද්‍යාලය නියෝජනය වූයේ තඹරළුවේ හිමි වැනි, කෙලින්ම ජ.වි.පෙ. නොවේ යැයි පෙන්වූ අයගෙනි. පේරාදෙනියේ තත්වය ද එලෙසම විය. මෙම 1985 වසරේ දී, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරී කමිටුව නායකත්වය තුල (අප මෙය ඇක්ෂන් කමිටී හෙවත් ඒ.සී. කියා හැඳුන්වූ අතර අනෙක් බොහෝ විශ්ව විද්‍යාල වල එය ප්‍රසිද්ධ වූයේ ඇක්ෂන් එක කියා ය.) ජ.වි.පෙ. ක්‍රියා කළේ පසුපෙල සිට ය. කෙසේ වෙතත් මේ දෙපිරිස අතර පැවති සටනින් පසු පැවති අවිශිබම රැස්වීම අති තීරණාත්මක එකක් විය. එදින කොළඹ සරසවිය නියෝජනය කිරීමට පොදු ශිෂ්‍ය කණ්ඩායමේ නියෝජිතයාට අමතරව ජ.වි.පෙ. නියෝජනය කරමින් සරත් එදිරිසිංහ වැනි නමක් තිබූ ශිෂ්‍යයෙකු ද පැමිණ සිටියේය. ඔහුගේත්, තඹරළුවේ හිමි ගේත් අති උද්වේගකාරී කතාවන් හි පොදු ඉලක්කය වූයේ දයා පතිරණ සහ ස්වාධීන ශිෂ්‍ය කණ්ඩායමයි. මෙම රැස්වීමේ කැඳවුම්කරු වූයේ පසු කළෙක ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමජිකයෙකුව සිට මරණයට ලක් වූ, රංජිතම් ගුණරත්නම් ය. දයා පතිරණ තව දුරටත් කොළඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍යයෙකු නොවේය යන තර්කය ඔස්සේ මෙදින ඔහු අවිශිබම නියෝජිත කමෙන් නෙරපුනි. එම තීරණයට හිස නැමූ දයා පතිරණ, කොළඹ විශ්ව විද්‍යාලයේ රීඩ් මාවතේ ශිෂ්‍ය මධ්‍යස්ථානයේ පැවති එම රැස්වීමෙන් ඉවත්ව ගිය ආකාරය මට දැනුදු මැවී පෙනේ. එය එසේ සිදු වූවද, සභාවේ මුලාසනය දැරූ රංජිතම් එවකට ලියාපදිංචි ශිෂ්‍යයෙක් නොවීය. එකම වෙනස වූයේ රංජිතම් ශිෂ්‍ය භාවය තහනමකට ලක් වී සිටි අයෙකු වීමයි.

මේ සිදුවීම් මාලාවේ මීලඟ වැදගත් සිද්ධිය වන්නේ 1985 වසරේ සැප්තැම්බරයේ පමණ දේශපාලන කටයුත්තක් සඳහා යැයි නුවර පැමිණි දයා පතිරණ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ රැයක් නවාතැන් ගැනීම ය. මෙම කාරණය නිසා සමාජවාදී ශිෂ්‍ය පෙරමුණ කෙතරම් සලිත වූවා ද යත්, ඉන් පසු නුදුරු දිනක පැවති ක්‍රියාකාරී කමිටු රැස්වීමේ දී, මේ පිළිබඳව මහා කළබගෑනියක් කරන්නටත්, ඔවුන්ට නවාතැන් දුන් ශිෂ්‍යයා ට විරුද්ධව අභූත චෝදනා නගන්නටත් ඔවුන් පෙළඹුනහ. අරුමයක මහත, ජ.වි.පෙ. අනුබද්ධ ඒ ශිෂ්‍යයන් ගේ ප්‍රධාන තර්කයක් වූයේ, දයා පතිරණ ඇතුළු පිණිස අන්ත රැඩිකල්වාදී පිරිසක් බවත්, ඔවුන් ගේ දේශපාලනය විශ්ව විද්‍යාලය සතු දේපල, සම්පත් විනාශකරණ ආකාරයේ එකක් නිසා ඔවුන් පේරාදෙනිය විශ්ව විද්‍යාලය තුලට වැද්ද ගත නොයුතු බවත් ය. මෙම තර්කය මට එක් වරම සිහි කරවූයේ, ඉහත සඳහන් කළ මගේ කවියේ එන බලහත්කාරෙන් හෝ හිරු පුබුද හෙට මුළු ලෝකය එළිය කළ යුතුය යන යෙදුම සහ එයට ජ.වි.පෙ. දැක්වූ ප්‍රතිචාරයයි.

තර්ක විතර්ක කෙසේ වූවද, මේ සියල්ලටම මුලික හේතුව වූයේ විශ්ව විද්‍යාල තුල බල අරගලයට වඩා ඒ වන විට ජ.වි.පෙ. විසින් උතුරේ ප්‍රශ්ණය මුල් කරගෙන ගෙන ගිය දේශපාලන මතවාදය හා වැඩ පිළිවෙල සහ උතුරේ ජනතාවගේ ස්වයං නීර්ණය වෙනුවෙන් පෙනී සිටි දයා පතිරණ ලා ගේ දේශපාලනය අතර තිබූ මත අරගලය බව මම සිතමි.

මින් සුළු කාලයකට පසුව මා විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය නිම කල අතර හුදු ශිෂ්‍ය ප්‍රශ්ණ මත සටන් කළා මිස කිසි කළෙක කිසිදු පිටස්තර පක්ෂ දේශපාලනයක නිරත නොවුන බැවින් මගේ ක්‍රියාකාරී දේශපාලනය එතැනින් අවසන් විය. මීලඟ වසරේ දී (1986) ජ.වි.පෙ., ඔවුන් ට අනුබද්ධව සමාජවාදී ශිෂ්‍ය සංගමයට සමාන්තරව, දේශප්‍රේමී ශිෂ්‍ය පෙරමුණ පිහිටුවන ලදී. අද දක්ෂිණාංශික දේශපාලනයක යෙදෙන ඇමතිවරයෙකු වන චම්පක රණවක ද මේ දිනවල සහ ඉන් පසුව එලැඹුණු භීෂණ සමය තුලදීත් ක්‍රියාකාරී ශිෂ්‍ය දේශපාලනයේ යෙදුන බව 1990 දී ඔහු දිවයින පුවත් පතේ පල කළ ලිපි මාලාව මගින් එළිදරව් කළේ ය. දේශප්‍රේමී ශිෂ්‍ය ව්‍යාපාරයේ පොදු සටන් පාඨය වූයේ

10 වන පිටට

ALG
& ASSOCIATES

FOR ALL YOUR TAXATION, ACCOUNTING & BOOKKEEPING NEEDS

- Individual & Business Income Tax Returns (Partnership, Trust & Company)
- Self Managed Superannuation Funds
- Accounting & Bookkeeping
- Business Activity Statements (GST Returns) & Instalment Activity Statements
- Company Secretarial
- Business Consultants
- Tax Planning

Arjuna Gunawardena CPA B.Ec
Registered Tax agent

ABN 63 865 123 157
PO Box 1335 Glen Waverly 3150
Tel - (03) 9802 3322
Fax - (03) 9802 6654
Mobile - 0438 194 827
Email - aplus_ms@bigpond.net.au

Have Peace of Mind....talk to us
ඔබේ සිතට සැනසුම ලබාගන්න . . . අදම අප අමතන්න



ඔබේ මූල්‍ය අවශ්‍යතාවයන්ට
අපෙන් නොමිලේ උපදෙස් හා සේවා රැසක්

Aplus Mortgage Solutions

We will help you to solve your financial needs.

We deal with reputed banks and other financial institutions.
We are confident of giving the fitting product to meet your needs.

We can help you with
Home Loans
Business Loans
Construction Loans
Lines of Credit
Debt Consolidation
Investment Loans
Low Doc and No Doc Loans
Commercial Loans
Zero Deposit Loans

We can also help you with a FREE Mortgage Health Check to see whether your present arrangements are adequate

MIAA

Call our mortgage consultant
Arjuna Gunawardena CPA B.Ec
on (03) 9802 3322 0438 194 827
or e mail us aplus_ms@bigpond.net.au

Ace Financial Solutions Pty Ltd trading as Aplus Mortgage Solutions
ABN 49 111 011 182 P O Box 1335 Glen Waverley Victoria 3150
Telephone +61 3 9802 3322 Facsimile +61 3 9802 6654 Email aplus_ms@bigpond.net.au